# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1802/7 - 2013 මාර්තු මස 18 වැනි සඳුදා - 2013.03.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

LA/2041.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, කරගොඩ - උයන්ගොඩ ජල සම්පාදන ක්‍රමයේ අංක 1 පොම්පාගාරය ඉදිකර ඇති ඉඩම් කොටස අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 මාර්තු මස 12 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1000.

**උපලේඛනය**

මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 318 A, ගෝදාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගෝදාව ගමේ පිහිටි, බෝගහඔිකන්ද නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 16 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :–

| | | |
|---|---|---|
| *උතුරට* | : | කඹුරුපිටිය - කද්දූව පාර ; |
| *නැගෙනහිරට* | : | කිරම ආර ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 1. විහාරාධිපති,
ශ්‍රී බෝධිරාජාරාමය,
ගෝදාව,
කඹුරුපිටිය.

04 - 47


1A - G 17444 — 350 (2013/03)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

LA/1983.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, දැදුරුඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රයේ ආරක්ෂාව සඳහා වෙන්කර ඇති ඉඩම් කොටස අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 මාර්තු මස 12 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1001.

**උපලේඛනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාරම්පොල ග්‍රාම නිලධාරී වසමේ, දැදුරුඔය - තෝරයාය ගමේ පිහිටි, කෝන්ගහමුලවත්ත සහ අස්ලියැද්ද නමැති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 5.8 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :–

| | | |
|---|---|---|
| *උතුරට* | : | බ. මි. සැ. අංක 2810 හි කැබලි අංක 01 ; |
| *නැගෙනහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු ඉඩම ; |
| *දකුණට* | : | බ. මි. 963 හි කැබලි අංක 11 ; |
| *බටහිරට* | : | බ. මි. සැලසුම් අංක 2810 කැබලි අංක 01. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 1. කේ. ඒ. ස්ටීවන් මයා,
දැදුරුඔය, තෝරයාය.

04 - 48

---

LA/2037.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, පොල්ගහවෙල අලව්ව ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ කිරිවානපොල ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 මාර්තු මස 12 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1002.

උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිවානපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිරිවානපොල ගමේ පිහිටි, වැලිකන්ද මූකලාන නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු එම්. පී. අයි. කේ. පතිරණ මහතා විසින් පිළියෙල කරන ලද අංක 1148 පිඹුරෙහි දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 07 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :–

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : අවසාන ගම් පිඹුරු 443 හි කැබලි අංක 78 ;
*බටහිරට* : ප්‍රාදේශීය සභා මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :*

1. ටී. ඩබ්. සෙනෙවිරත්න මයා.
2. ටී ඩබ්. චන්ද්‍රාවතී මිය.
3. ටී. ඩබ්. සීලවතී මැණිකේ මිය.
4. ටී. ඩබ්. සනත් දයානන්ද මයා.
5. ටී. ඩබ්. කුසුමාවතී මිය.
6. ටී. ඩබ්. මාලනී හේමලතා මිය,
   අංක 160/1, වැත්තෑව පාර,
   තිරිවානාපොල,
   මහරච්චිමුල්ල.

04 - 49

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.